# ප්‍රසම්පාදන දැන්වීම

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ

## මාතලේ එම්.සී පාර, නව තෙමහල් නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම් කටයුතු දෙවන පියවර

## (B ගොඩනැගිල්ල - අදියර 2)

**ප්‍රසම්පාදන අංකය-DSM/ACC/16/NCB/2025/01**

මෙම කාර්යාලයේ දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් මාතලේ එම්.සී.පාර පිහිටි තෙමහල් නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම (දෙවන අදියර) සඳහා ජාතික තරඟකාරී මිල කැඳවීමේ ක්‍රමය යටතේ ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය ලැබූ, අසාධු ලේඛනගත නොවූ, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසු කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| ප්‍රසම්පාදනයේ නම | ඇස්තමේන්තු වටිනාකම (වැට් රහිත) රුපියල් මිලියන | ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. සත | ලංසු වලංගු කාලය | ලංසු සුරක්ෂණයේ වලංගු කාලය | කොන්ත්‍රාත් කාලය | යෝග්‍යතාවය CIDA (ගොඩනැගිලි) |
|---|---|---|---|---|---|---|
| මාතලේ එම්.සී පාර, නව තෙමහල් නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම් කටයුතු දෙවන පියවර (B ගොඩනැගිල්ල - අදියර 2) | 42.0 | 475,000.00 | දින 91 | 2025/08/30 | සති 30 | C5 හෝ ඉහළ |

02. ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලේඛන 2025.04.07 වන දින සිට 2025.04.30 දින දක්වා සතියේ වැඩ කරන දිනවල ප.ව 3.00 තෙක් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත රු.12,500/- ක ආපසු නොගෙවන මුදලක් ගෙවා ලබාගත් රිසිට් පතක් හා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ගිණුම් අංශයෙන් ලබාගත හැක.

03. මෙම ප්‍රසම්පාදනයට අදාළ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම, 2025.04.21 වන සඳුදා දින පෙ.ව 10.00 ට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිව්වන මහලේ පිහිටි රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගී විය හැක.

04. ලංසු සුරක්ෂණය **"දිස්ත්‍රික් ලේකම් ,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මාතලේ"** නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් ඉහත සඳහන් වටිනාකමින්යුත් 2025.08.30 දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් විය යුතු අතර, එසේ නොමැති නම් එම වටිනාකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් තැම්පත් කිරීමෙන් සිදු කළ හැක.

05. ලංසුකරු විසින් ලංසු පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත හා අනු පිටපත වෙන් වෙන්ව කවරවල බහා පසුව තනි කවරයක් ලෙස (මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ප්‍රසම්පාදන අංකය හා කොන්ත්‍රාත්තුවේ නම පැහැදිලිව ලියා තිබිය යුතුය.) සකස් කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ 2025.05.02 දින ප.ව 2.30ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ලංසු ඉදිරිපත් කළ හැකිය.(තැපෑලෙන් සිදුවන ප්‍රමාදයක් සම්බන්ධයෙන් වග කියනු නොලැබේ.)

06. 2025.05.02 දින ප.ව 2.30 ප්‍රධාන ගණකාධිකාරී නිල කාමරයේදී ටෙන්ඩර් පෙට්ටිය වැසීම සිදු කර එසැනින් ලංසු විවෘත කිරීම සිදු කරන බැවින්, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

07. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් හා වැඩි විස්තර, ප්‍රධාන ගණකාධිකාරී දුරකථන අංක **0662222709** මඟින් අමතා ලබා ගත හැකිය.

**දිස්ත්‍රික් ලේකම්/ ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**මාතලේ.**

CamScanner